සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 1 යි. |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

iv) I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් **සමීප** අර්ථය දෙන, වචනය තෝරන්න.

(01) "**හිතේ කහටක්** තියාගෙන නම් අපේ ගෙදර එන්න එපා"යි අත්තම්මා චෝදනා මුඛයෙන් පැවසුවා ය.

(1) කරදරයක් (2) චෝදනාවක්
(3) අමනාපයක් (4) පසුතැවිල්ලක්

(02) "හිටවපු පැළ ටික සේරම **හේ බාලා**"යි උක්කුරාල අහස් දෙස බලමින් මුමුනන්නට විය.

(1) විනාශ වෙලා (2) මැලවිලා (3) පාළු වෙලා (4) කේඩෑරි වෙලා

(03) අනතුර ගැන ඇසූ විට තමාට **ගිනි පත්තු වූ** බව මුරකරු කී ය.

(1) බියට පත් වූ (2) කරදරයට පත් වූ
(3) අසහනයට පත් වූ (4) ලැජ්ජාවට පත් වූ

- අංක 4 සිට 7 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(04) ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ .......................... මහින්ද හිමියෝ කවි ලියූ හ.

(1) කැමැත්තෙන් (2) ස්වෙච්ඡාවෙන්
(3) උනන්දුවෙන් (4) පරමාභිලාෂයෙන්

(05) සංඝමිත්තා තෙරණියගේ ආගමනය සමස්ත සමාජ .......................... කෙසේ බලපෑවා ද'යි විමර්ශනය කිරීමට සුදුසු අවස්ථාවක අපි සිටිමු.

(1) ස්ථාවරයට (2) ස්තරයට (3) ස්වාර්ථයට (4) සුසාධ්‍යයට

(06) ............................... යනු තමා විඳින අත්දැකීම් ඇසුරෙන් අපූර්ව වස්තු නිර්මාණය කර ගැනීමේ හැකියාවයි.

(1) අනුප්‍රාසය (2) සතතාභ්‍යාසය (3) ඖචිත්‍යය (4) ප්‍රතිභාව

(07) භාෂාවෙහි බුද්ධිගෝචර වන කොටස පමණක් නොව .................. වන කොටස ද දැනගත යුතු වේ.
(1) හෘදය ගෝචර (2) දෘෂ්ටි ගෝචර (3) නයනාකර්ෂණ (4) කර්ණ රසායන

(08) "රුක් අත්තන පෙතන් පලු බෝ මී කහට" යන කවි පදයේ වචන අකාරාදී පිළිවෙළට සැකසූ විට මුල හා අගට යෙදෙන පද දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පලු - පෙතන් (2) බෝ - මී (3) කහට - රුක් අත්තන (4) පෙතන් - මී

(09) අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද ඇතුළත් පේළිය තෝරන්න.
(1) සුනේත්‍රා, සක්වා ලිහිණි, සිංහබාහු, සුබ සහ යස
(2) අමාවතුර, පූජාවලිය, බුත්සරණ, වෙසතුරු දා කව
(3) ආවර්ජනා, රන්රෝස, බෝඩිම, වස්සානේ
(4) මයුර, පරෙවි, සැළලිහිණි, හංස

(10) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) මේ පද සංයෝජනයෙන් මෙබඳු ව්‍යංගාර්ථයක් දැනවේ.
(2) බස දන්නා සියළු දෙනා කාව්‍යයේ රස විඳිති.
(3) බස ඉතා සූක්ෂම ලෙස පරිහරනය කරන්නේ කවීන් විසිනි.
(4) විචාරකයින්ගේ විවේචන කියැවීමෙන් පොදු ලෝකයාත් කාව්‍ය රස වින්දනයට පෙලඹේ.

(11) මෙහි මූර්ධජ අක්ෂර පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ත, ද, ෂ, ව (2) ණ, ග, ට, ප (3) ක, ච, ද, ම (4) ට, ඩ, ණ, ෂ

(12) පහත දැක්වෙන පද අතුරෙන් මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) භාෂණ, සර්ෂණ, සාධන, නිෂ්ප්‍රභ (2) කනිෂ්ඨ, පාඨ, ඖෂධ, භක්තිය
(3) ආභාසය, ශිෂ්ටාචාරය, නිෂ්ඵල, ධාරිතා (4) අධ්‍යක්ෂ, ඡේදනය, අභ්‍යාස, කොට්ඨාස

(13) වනවිල වැද බොල් සෙවෙලැ'ඟ තවරා
ගනවල් කැල ඇරගෙන අතිනු දුරා
දිගු උල් සිඟු යොමු කැර කර අඹරා
පිළිමල් වන මීවුන් දකු නුදුරා

මෙම කවියෙහි ඇතුළත් සඤ්ඤක අක්ෂර ගණන
(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

(14) උක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අපි, කෙනෙක්, ඇතැම්හු, ගුරුවරු (2) තොප, මම, ගැහැනියක්, ඕ
(3) පූජකයෝ, සතෙකු, දූරියක, තෝ (4) මිනිසුන්, සුරන්, නරන්, ඔවුන්

(15) සමානාර්ථවත් පද යුගලයක් නොවන වරණය තෝරන්න.
(1) උළිඳු - තරිඳු (2) දිනකර - නිසයුරු (3) පත්ම - කමල් (4) ස්වර්ණ - කනක

(16) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) නිතර - සතත (2) උතුම් - පවර (3) සීවුල - පෑවුල (4) කටුක - මධුර

(17) මුලින් දී ඇති පදයට විවිධාර්ථවත් පද පමණක් ඇති වරණය තෝරන්න.
(1) මුව - මුඛය, මුවා, මිහි, වත (2) කල - ස්ත්‍රිය, කාලය, යහපත්, කුරුල්ලා
(3) දන - ජනයා, ධනය, දානය, ධාන්‍ය (4) පව් - පාපය, තාප්පය, පර්වතය, වර්ණය

(18) නොගැළපෙන යුගල පදයක් සහිත වරණය තෝරන්න.

(1) අලාභහානි, අරුමපුදුම, ගරුනම්බු, යානවාහන

(2) ඇතමැත, යනඑන, ඔබමොබ, කුදුමහත්

(3) යමක්කමක්, කුලීමලී, පඩිනඩි, අයවැය

(4) හාවක්හුවක්, අතන්මතන්, වංහුං, ලට්ටලොට්ට

(19) පූර්ව ස්වර ලෝප සන්ධි විධියට උදාහරණයක් නොවන පදය තෝරන්න.

(1) නිරිඳු (2) මුනිඳු (3) සුරිඳු (4) දිනිසුරු

(20) මුලින් දී ඇති සන්ධි පද නිවැරදි ව විසන්ධි කර දක්වා ඇති වරණය තෝරන්න.

(1) රුවනාර, දෑත - රුවන + ආර, දෙ + අත

(2) නොයෙක්, මුනිතුමා - නො + යෙක්, මුනි + උතුමා

(3) ගංදිය, තුනුවඟ - ගඟ + දිය, තුනු + අඟ

(4) ඇත්කල, දුග්ගන්නා - ඇත් + අල, දුක් + ගන්නා

(21) නිවැරදි තනි පදය යෙදී නැති වරණය තෝරන්න.

(1) සෑම අයුරින් ම සම්පූර්ණ - පරිපූර්ණ

(2) සහමුලින් විනාශ කිරීම - සමූලඝාතනය

(3) සියල්ලන්ගේ අනුමැතිය ලද - ඒකමතික

(4) සලකුණු කරන ලද - අධෝලිපිය

(22) පහත දැක්වෙන කවි පදවල උපමාවක් යෙදී නැති කවි පදය තෝරන්න.

(1) හැම ගනඳුරු බොන වර නිසයුරා ගත

(2) නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත

(3) කෙළන රුසිරි රනෝවිලි වන

(4) ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර

(23) රූපකයක් යෙදී ඇති කවි පදය තෝරන්න.

(1) ගැබ් වුණ සිසිල එයි ඊතල පරිදි මෙහේ

(2) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

(3) ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත

(4) මවු ගුණය ඇති අය දරුවන් දිනිය යුතු වෙයි

(24) නාම ප්‍රකෘති පමණක් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ගවයා, මී, රට, සිංහ

(2) දරු, මිනිස්, ගස්, බලු

(3) ශිෂ්‍යයා, පොරෝ, කතුරු, පුටු

(4) මේස, ගැහැනි, ලේනා, නායකයන්

(25) ඉරි ඇඳි පදවල ක්‍රියාපද වර්ගය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

<u>අසනු මැන</u> දූන් අයුරු විසඳුව
නිවා, තාරකා <u>පියවා ගෙන</u> දෑස
කොළ විතරක් ම <u>වන</u> <u>වන</u>
තර පතරින් සඳ 'දර තර පහර <u>දෙත</u>

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

(26) මුලින් දී ඇති ව්‍යාකරණ විධියට නොගැළපෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
   (1) තද්ධිත - රන්මුවා, ජනතා, දිගටි, ගැමි
   (2) නිපාත - සේ, පිණිස, බැගින්, වැළි
   (3) උපසර්ග - ප්‍රතිවාදී, අසාධ්‍ය, නොමනා, ප්‍රතිචාර
   (4) කෘදන්ත - බැලෙන, පැවසුණු, වැදූ, නැටිලි

(27) වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
   (1) අව්‍යය පද ගණයෙහි ලා සැලකෙන පද වර්ග දෙකකි.
   (2) සන්ධි යනු උච්චාරණයේ පහසුව සඳහා සිදුවන ශබ්ද ගැළපීමේ ක්‍රමයකි.
   (3) අදහස් ප්‍රකාශනය සඳහා යොදා ගන්නා අරුත් සහිත භාෂාමය ඒකක පද නමින් හැඳින්වේ.
   (4) භාෂාවක ලේඛන ව්‍යවහාරයේ දී නිවැරදි අක්ෂර භාවිතය අක්ෂර මාලාව නම් වේ.

(28) පහත (අ) (ආ) කොටස් යටතේ දක්වෙන පදවල අර්ථය වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වර්ණය වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| A. පරිශීලනය | E. සත්‍ය වචන |
| B. සබවස | F. හෙණ්ඩුවෙන් |
| C. අකුස්සෙන් | G. ස්ත්‍රියක් |
| D. මාගමක් | H. හැදෑරීම |

(1) A සහ F   (2) D සහ G   (3) D සහ E   (4) B සහ H

(29) මෙම ප්‍රාදේශීය ව්‍යවහාරය හා බැඳුණු සාමාන්‍ය ව්‍යවහාරය වැරදි ලෙස යොදා ඇති වරණය තෝරන්න.
   (1) දොරං - දොරවල්, ඉඟුරු - ඉරිඟු, පැපොල් - ගස්ලබු
   (2) පුහුල් - වට්ටක්කා, බීවා - බුන්නා, අම්මණ්ඩි - අම්මා
   (3) පුන්නච්චා - නිදිකෙරුවා, අප්පුච්චා - තාත්තා, මොක්කු - කවුරු
   (4) කොකිස් - කිරි අල, බලච්චා - බැලුවා, බක්කම්මා - ලොකු අම්මා

• 30 සිට 33 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(30) (1) වෛද්‍යවරුන් පස් දෙනෙක් ශල්‍යකර්මය සාර්ථක ව නිම කළෝ ය.
   (2) සාමාජිකයෝ සියල්ලෝ ම පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ.
   (3) ජයග්‍රාහකයන් සියලු දෙනා උත්සවයට සහභාගී වූහ.
   (4) ඔවුන් හැම ශ්‍රී ලාංකිකයෝ වෙති.

(31) (1) චිත්‍ර ශිල්පීහු සම්මානයෙන් පිදුම් ලැබී ය.
   (2) අප එතනට කැඳවූයේ ඔවුහු විසිනි.
   (3) සංචාරකයින් විසින් වන සත්තු දක්නා ලදහ.
   (4) ශිෂ්‍යයන් විසින් ලියූ නාට්‍යය වේදිකාගත කරයි.

(32) (1) ඕ තොමෝ විශිෂ්ටතා උපහාරය ලැබීය.   (2) සයුරු තෙම මහ රළ නංවයි.
   (3) ඇදුරු තුමූ ශිල්ප උගන්වයි.   (4) සොබා දම් තොමෝ නෙක විසිතුරු මවති.

(33) (1) සිසු කැල චාරිකාවේ යෙදෙයි.   (2) ධ්වජ පන්තීන් සුළඟේ ලෙළ දෙති.
   (3) පලබර අඹ වෘක්ෂයෝ සතුනට ආහාර සපයයි.   (4) ඔවුන් එය දූන ගැනීම මැනවි.

(34) "උඹලා මගේ දරුවෝ" කිව්වලු සාර්තුමා. මිනිසුන්ට කියලා, උන්ගේ හිස ගසා දැම්මලු!
ඉහත වාක්‍යයේ සඳහන් නොවන විරාම ලක්ෂණය වන්නේ,

E - තනි උඩු කොමාව　　F - නැවතීමේ ලකුණ　　G - කොමාව　　H - විස්මයාදී ලකුණ

(1) E　　(2) F　　(3) G　　(4) H

- 35 - 36 ප්‍රශ්නවල දී ඇති අදහසට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම ඇතුළත් වරණය තෝරන්න.

(35) උඩඟුකමින් කටයුතු කිරීම නිසා විනාශයට පැමිණේ.

(1) අනේ කාලේ වනේ වාසේ　　(2) උඩ පැන්නොත් බිම වැටේ
(3) අශ්වයාට අං ලැබුණා වගේ　　(4) ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ

(36) හේතුවක් නොමැතිව කිසිවක් සිදු නොවේ.

(1) උගුරටත් හොරා බෙහෙත් කනවා වගේ　　(2) යන්නේ කොහෙද මල්ලේ පොල්
(3) අරුම පුදුම රටේ පණමට පොල් හැටේ　　(4) ගින්නක් නැතිව දුමක් නොනගී

(37) කළ නොහැකි දේ ගැන කල්පනාවේ යෙදීම.

(1) ගඟෙන් දිය බී මුහුදට ආ වඩන්නා සේ　　(2) ගමරාලගේ වං ගෙඩිය වගේ
(3) ආටානාටිය කියනවා වගේ　　(4) අහසේ මාලිගා තනනවා වගේ

- 38 - 39 ප්‍රශ්නවල දී ඇති යෙදුම්වල අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(38) සරත දුරා කැරැ නහවනුව　　　සමුදුරා
සහසකුරා කර ඇදි වැන්න තම　　　කරා

(1) සූර්යයාගේ වෙහෙස දුරු කර දිය නාවනු සඳහා රශ්මිය නැමැති අතින් මුහුද තමා කරා ඇද ගන්නා වැනි ය.
(2) සරත් කාලයේ සමුදුරෙහි බැස දිය නෑමට, දහස් ගණන් දේදුනු තමන් කරා ඇද ගන්නා වැනි ය.
(3) වෙහෙස නිවා සමුදුරු ජලයෙන් දිය නෑමට සැරසෙන සූර්යයා සයුර තමන් වෙත ඇද ගනී.
(4) තමා කරා ඇද ගත් සමුදුර දිය නෑමට සූර්යයා කැඳවන්නා වැනි ය.

(39) යම් රටක පැවැත්වෙන උත්සව, චාරිත්‍ර, වත් පිළිවෙත් හා ඇදහිලි විශ්වාස එම රටේ වසන ජනතාවගේ අනන්‍යතාව පිළිබිඹු කරන කැටපතක් බඳු ය.

(1) යම් රටක සාරධර්ම එහි වෙසෙන ජනයාගේ අනන්‍යතාව පෙන්වයි.
(2) යම් රටක වාර්ෂිකව පවත්නා විවිධ උත්සව එරට ජාතික අනන්‍යතාවේ කැටපතකි.
(3) යම් රටක ජාතික අනන්‍යතාවයේ කැඩපත වන්නේ එහි වෙසෙන මිනිසුන්ගේ සිරිත් විරිත් ය.
(4) යම් රටක සංස්කෘතිකාංග එම රටේ වසන ජනතාවගේ අනන්‍යතාව පෙන්නුම් කරන කැඩපතක් වැනි ය.

(40) මෙම චරිත ඇතුළත් පාඩම් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

ඊයෝහෙයි, සයිමන්, බුරම්පි සීයා, යසෝමා

(1) තොරොක්කෝව, හුණුවටයේ කතාව, ආපදා කළමනාකරණය, මං තනන්නෝ
(2) තොරොක්කෝව, ආපදා කළමනාකරණය, හුණුවටයේ කතාව, මං තනන්නෝ
(3) මං තනන්නෝ, හුණුවටයේ කතාව, ආපදා කළමනාකරණය, තොරොක්කෝව
(4) ආපදා කළමනාකරණය, මං තනන්නෝ, හුණුවටයේ කතාව, තොරොක්කෝව

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

20097

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 2 යි. |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. • අංක i සිට x තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(I) ආ) සිංහල අක්ෂර මාලාවෙහි ඇති ඝෝෂ මහාප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න.
ආ) "ර" සහ "ව" යන අන්තඃස්ථ අක්ෂර නියෝජනය කෙරෙන ස්වර ශබ්ද පිළිවෙළින් ලියන්න.

(ii) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට ලියන්න.
අ) බහු + අර්ථ ආ) ඇත් + දෙමට

(iii) "ළ" සහ "ත" යන අක්ෂර සඳහා කෙටි පාපිල්ල යොදා අර්ථවත් වචනය බැගින් ලියන්න.
අ) ළ .............................. ..............................
ආ) ත .............................. ..............................

(iv) ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි පහත දැක්වෙන ප්‍රකාශ සඳහා දැක්වෙන අර්ථ ලියන්න.
අ) රතු වූ තුඩු හා පා ඇති හංසයා ආ) සියලු කලාවන්ට අධිපති දෙවඟන

(v) පහත දැක්වෙන තත්සම ශබ්දවලට අදාළ තද්භව ශබ්ද ලියන්න.
අ) ඡේදනය ආ) ශ්‍රවණ

(vi) "එක්කෝ අපි නිහඬ වෙමු" මෙහි සඳහන්
අ) නිපාත පදයක් ආ) උපසර්ග පදයක් ලියන්න.

(vii) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවන්න.
අ) ඇතැම් ජන මාධ්‍යකරුවෝ සිංහල බස මනාව හසුරුවති.
ආ) මහෞෂධ පඬිතුමා විසින් කේවට්ටයා පරදවන ලදී.

(viii) පහත ප්‍රාදේශික ව්‍යවහාරයෙන් ලියා ඇති වාක්‍යය පොදු ව්‍යවහාරයෙන් ලියන්න.
අ) "ඒකා ගියා සකලයන් අඹන්ට" ආ) "කුඩප්පච්චී පොල් ඔයනව ද?"

(ix) "ලකළ ගුවන්තල සිරියහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙන තුරු වැල

මෙම පද්‍ය පාදයෙහි සඳහන්
ආ) උපමාව
ආ) රූපකය ලියන්න.

(x) යට දැක්වෙන ඉඟි වැකිවලින් කියැවෙන අර්ථ ලියන්න.
අ) කඹ ඇදීම
ආ) අගේ ඉඳන් කන කනවා (ලකුණු 2 x 10 = 20)

02. පහත දැක්වෙන ව්‍යුහගත ඡේද අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.
ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙළ

ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබාගන්න.

අ) අනාගත ලෝකය ගොඩනැගෙනු ඇත්තේ මූල්‍යමය ප්‍රාග්ධනය මත නොව ඥානය මත යැයි සමහරු කියති. මේ ඥාන සම්භාරයෙහි එක් අංශයක් වන්නේ පාරම්පරික හැකියාවයි. මේ සඳහා නව මං පෙත් විවර කරදීමත් නිසි ඇගයීමක් ලබා දීමත් කෙරෙහි අවධානය යොමු විය යුතුයි.

ආ) ලොව දේශගුණික රටාව බලවත් ආකාරයෙන් විපත්තිකර වෙනසකට පත් ව ඇත. ඇතැම් මිනිස් ක්‍රියාකාරකම් නිසා පෘථිවි ගෝලය අස්වාභාවික ලෙස උණුසුම් වීම මෙයට ප්‍රබල හේතුවකි. මෙයින් සිදු වන හා සිදු විය හැකි විපත් බොහෝ ය. මේ තත්ත්වය මඟ හරවා ලෝක දේශගුණික රටාව මිනිසාට හිතකර ලෙස හැඩගස්වා ගැනීම අප හමුවේ ඇති ගැටලුවකි.

ඉ) රජරට ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාප්ත වන වකුගඩු රෝගය ව්‍යසනයක් බවට පත් වී ඇත. රටට ම බත සපයූ ගොවීන් අද රෝගීන් බවට පත් වී ඇත. විවිධ හේතු මේ සඳහා බලපාන බව වෛද්‍යවරු පවසති. මේ ව්‍යවසනයට කඩිනමින් ප්‍රතිකර්ම යෙදිය යුතු බව කාගේත් අදහසයි. මේ ප්‍රශ්නයට රාජ්‍ය මැදිහත්වීම අවශ්‍ය වේ.

ඊ) විදුහල්පතිතුමාගේ කාර්යාලයට පැමිණෙන ලෙස ලැබුණු පණිවුඩයක් සමග මට ඇතිවූයේ කුතුහලයකි. ධෛර්යයෙන් යුතුව එහි පිය නැගූ විට ප්‍රසන්න සිනහවකින් මට සංග්‍රහ කළ එතුමා ජාත්‍යන්තර තරගයක් සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලැබූ සිතුවමට සම්මානයක් හිමි වී ඇති බව පැවසුවේ ය.

(ලකුණු 25 යි.)

03. පහත දැක්වෙන ඡේදය වචන 50 - 55 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

මනා පෞරුෂයකින් යුක්ත පුද්ගලයෙකු බිහි කිරීම අධ්‍යාපනයේ පරමාර්ථයක් ලෙස සැලකේ. සාමාන්‍ය ව්‍යවහාරයේ දී පෞරුෂය යන්න පුද්ගලයාගේ බාහිර ලක්ෂණ, එනම් ඇවිදින, කථාකරන, අඳින පලඳින ආකාරය සහ සමාජ කණ්ඩායමක් සමග හැසිරෙන ආකාරය වැනි ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් නිශ්චිත කෙරෙතත් මනෝ විද්‍යාවේ දී මේ සඳහා පුළුල් හා ගැඹුරු අර්ථකථනයක් දෙයි. විසිවන සියවසේ මුල් භාගයේ සිට ම පෞරුෂය යන්නට මනෝ විද්‍යාඥයන් ඉදිරිපත් කර ඇති අර්ථකථන රාශියකි. බ්‍රිතාන්‍ය ජාතික මනෝවිද්‍යාඥයෙකු වූ සිරිල් බර්ට් කිසියම් සමාජමය අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් පුද්ගලයා ප්‍රදර්ශනය කරන කායික හා මානසික ක්‍රියාවල ඒකාබද්ධ සංවිධානය පෞරුෂය ලෙස හඳුන්වන අතර ඇමරිකානු ජාතික අර්නස්ට් හිල්ගාඩ් පරිසරයට පුද්ගලයෙකුගේ සමායෝගය හෙවත් හැඩගැස්ම තීරණය කරන රටාවේ හා චින්තන ක්‍රමයේ එකතුව පෞරුෂය ලෙස දක්වයි.

මෙසේ ක්ෂේත්‍රයෙහි ඉදිරිපත් කර ඇති පෞරුෂය පිළිබඳ අර්ථ විග්‍රහයන් සියල්ල ම සාමාන්‍යකරණය කිරීමේ දී මෙය සෑම කෙනෙකුට ම බලපාන අතර පුද්ගලයන් අතර සමානතා මෙන් ම අසමානතා ද පෙන්වන සංකල්පයක් බව පැහැදිලි වේ. සමබර පෞරුෂයකින් යුත් පුද්ගලයාට තමා පිළිබඳ විශ්වාසයක් ඇත. තමා පිළිගත් ප්‍රතිපත්ති අදහස් උදහස් කෙරෙහි ඇති අචල විශ්වාසය නිසා ඔහුට බාධක හා එදිරිවාදිකම් හමුවේ නොසැලී සිටීමට ශක්තිය ලැබේ.

(ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂාව මානව වර්ගයාට සුවිශේෂී වූ සංසිද්ධියක් වශයෙන් හැඳින්විය හැකි ය. එයින් ගම්‍ය වන්නේ වෙනත් සත්ත්ව වර්ගවලට ආවේණික වූ සන්නිවේදන මාර්ග භාෂාවක් යනුවෙන් හැඳින්විය නොහැකි බවයි. මී මැස්සන් වැනි ඇතැම් සත්ත්ව කොට්ඨාසවල සන්නිවේදන ක්‍රම මානව භාෂාවලට යම් යම් සමානතා දක්වතත් මානවයා සතු භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා බෙහෙවින් ප්‍රබල ද සංකීර්ණ ද වේ. මිනිසා භාෂාව යොදා ගන්නේ හුදෙක් තම පැවැත්ම සඳහා පමණක් නොවේ. අනුන් දැනුම්වත් කිරීමට මෙන් ම අනුන්ට තොරතුරු දැනුම් දීමට ද විනෝදාස්වාදය සැපයීමට මෙන් ම සුහදතාව ගොඩනගා ගැනීමට ද මිනිසා භාෂාව යොදා ගනී. වේදනාවක් නැති විටක පවා වේදනාවකින් කෑ ගසමින් ගීයක් ගැයීමට නළුවෙකුට හෝ නිළියකට පුළුවන. මිනිසා භාෂාව ලබා ගන්නේ සහජයෙන් ම නොවේ. ඔහු කටහඬත් කථා කිරීමේ ශක්තියත් සහජයෙන් ම ලබයි. එහෙත් ඒ කටහඬත් ශක්තියත් යොදා කථා කරන්නේ කවර භාෂාව ද යන්න තීරණය වන්නේ ඔහු හැදී වැඩෙන සමාජ පරිසරය අනුවයි.

මානව භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා ප්‍රබල වීමටත් සංකීර්ණ වීමටත් තවත් හේතුවක් වන්නේ එය සංකේතවලින් සෑදී තිබීමයි. සත්තු සන්නිවේදනයේ ලා සංකේත නොයොදති. හඬවල් විවිධාකාරයෙන් සන්නිවේදනය කිරීමටත් සත්ත්ව සන්නිවේදනයේ ලා සිදු නොවේ.

i. මිනිසා කථා කරන්නේ කවර භාෂාවක් ද යන්න තීරණය කරන සාධකය කුමක් ද?
ii. සතුන්ගේ ශබ්ද භාෂාවක් ලෙස සැලකිය හැකි නොවන්නේ කුමක් නිසා ද?
iii. මිනිසාට සහජයෙන් ම ලැබෙන ශක්තීන් දෙකක් ගැන මේ ඡේදයේ කියැවේ. ඒ මොනවා ද?
iv. නළුවෙකු හා නිළියක පිළිබඳ උදාහරණය ඉදිරිපත් කර ඇත්තේ කුමන කාරණයක් සම්බන්ධයෙන් ද?
v. සංකීර්ණ හා දැනුම්වත් යන වචන සඳහා විරුද්ධාර්ථ පද ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

05. අයිතිකරුවන් නොමැති ව නිකරුණේ ගැවසෙන සුනඛයින් හා වෙනත් සුරතල් සතුන් නිසා ලෝකය පුරා ජලභීතිකා රෝගයට ගොදුරු වන මිනිස් ජීවිත සංඛ්‍යාව ඉහළ යයි. මෙම රෝගයට ප්‍රතිකාර නොමැති වුව ද නිසි කලට එම සතුන්ට එන්නත් ලබා දීමත් නිකරුණේ ගැවසීමට නොදීමත් යන ක්‍රම තුළින් රෝගය මර්දනය කළ හැකි ය. මේ තොරතුරු ඇතුළත් කරමින් වසර 2020 වන විට ශ්‍රී ලංකාවෙන් ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අරමුණින් කොළඹ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා බෙදා හරින අත්පත්‍රිකාව සකසන්න.

(වචන 125 ක් පමණ සෑහේ.)

නැතහොත්

එක්තරා දේශීය ආයතනයකින් පොල්කටු අඟුරු මගින් ක්‍රියාත්මක නව මාදිලියේ උඳුනක් වෙළෙඳපොළට හඳුන්වා දීමට අදහස් කරයි. පරිසර හිතකාමී නිෂ්පාදනයක් වන මෙම නිර්මාණය සඳහා සුදුසු නමක්, එමගින් අත්වන ආර්ථික වාසි, එහි ගුණාත්මක භාවය, හා අලෙවියෙන් පසු සේවාව ආදිය සඳහන් කරමින් එම ආයතනයේ සියලු තොරතුරු ද දක්වමින් ආකර්ෂණීය වෙළඳ දැන්වීමක් සකස් කරන්න.

(වචන 100 - 125 ක් පමණ සෑහේ.)

(ලකුණු 15 යි.)

19917

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | III | පැය / மணித்தியாலம் / Hours | 2 යි. |
|---|---|---|---|---|---|---|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 යි.

---

01) අංක (i) සිට (x) තෙක් ඇති සියලු අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "දේවයෙනි, මහත් වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නො දනුම්හ."
   (අ) මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද?
   (ආ) මෙහි "දේවයෙනි" යනුවෙන් ආමන්ත්‍රණය කළේ කාහට ද?

(ii) ගුත්තිල ඇදුරු <u>සඳ</u>
   වීණා වයන ලෙස <u>ඉඳ</u>
   එසෙක පනවන <u>ලද</u>
   සුදුසු අස්නෙක ගොසින් උන් <u>සඳ</u>

   ඉරි ඇඳි පදවල අදහස ලියන්න.
   (අ) (ඇදුරු) සඳ -
   (ආ) (උන්) සඳ -

(iii) (අ) බැද්දේගම නමින් සිංහලයට පරිවර්තනය කළ මුල් කෘතිය කුමක් ද?
   (ආ) එහි මුල් කෘතියේ කතුවරයාගේ නම ලියන්න.

(iv) (අ) "සුවඳ" කවි සඟරාවේ සංස්කාරකවරයාගේ නම ලියන්න.
   (ආ) ඔහු නිර්මාණය කළ පද්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(v) කුමරියක් මනා
   පසිඳු මහඟු වංග දේසේ
   <u>නරවර හට දා</u>

   (අ) මෙහි සඳහන් කුමරියගේ නම සඳහන් කරන්න.
   (ආ) ඉරි ඇඳි කොටසේ අදහස ලියන්න.

(vi) "මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරූ දෑ නැතැ"
   (අ) මෙය කවුරුන් විසින් කියන ලද්දක් ද?
   (ආ) "ඇඹුල දණ්ඩක්" යනු කුමක් ද?

(vii) සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල් බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) මෙසේ නොසතුටට පත් වූයේ කවුරුන් ද?
(ආ) එසේ නොසතුටු වූයේ ඇයි?

(viii) "නොමියෙන හේලි දහමක පණිවුඩය පිට"
(අ) මෙම පද්‍ය පාදය උපුටා ගත් පාඩම කුමක් ද?
(ආ) හේලි දහම යන්නෙහි අදහස ලියන්න.

(ix) ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමියන්ගේ නිර්මාණ අතුරෙන්,
(අ) ළමා නිර්මාණ දෙකක් නම් කරන්න.
(ආ) ජාතිකාභිමානී නිර්මාණයක් නම් කරන්න.

(x) (අ) සිංහබාහු නාට්‍ය හැර සරච්චන්ද්‍ර මහතා කළ වෙනත් නාට්‍යයක් නම් කරන්න.
(ආ) ඔහු නිර්මාණය කළ නවකතාවක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20 යි.)

02. පහත දී ඇති ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

(i) කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලාදී වූ නා නා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නගන ලද නා නා ප්‍රකාර ධවලච්ඡත්‍ර පංක්තියෙන් ගැවසී ගත්තී ය.
(අ) මේ කුමන අවස්ථාවක් හා සම්බන්ධ වැනුමක් ද?
(ආ) ඉරි ඇඳි පදවල අදහස ලියන්න.

(ii) සිංහයෙකු විසින් රක්නා ලද රන් ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසි කෙනෙකුන් විසින් ගන්නට නො හැක්කී ය. ගියොත් හුදෙක් අපටම ලජ්ජා වන්නී ය. ඔබ ගමන නොකැමැත්තෙමි.
(අ) මෙසේ රකින ලද්දේ කුමන රාජ්‍යය ද?
(ආ) ඉරි ඇඳි කොටසේ අදහස ලියන්න.

(iii) කැර මිණි බරණ රැස්
රසින් සුර සැවු සුවහස්
සුරන් සහ සහසැස්
නොකැර සිටියේ අහස් කුස හිස්

(අ) මින් කියවෙන්නේ කුමන අවස්ථාවක් ගැන ද?
(ආ) ඉරි ඇඳි පදවල අදහස ලියන්න.

(iv) ඔවුන් ඒ වැඩ කරන්නේ ආසාවකින් හෝ සිහියකින් නොවේ. ගව මහිසාදීන් හෝ යන්ත්‍ර සූත්‍රාදියක් ක්‍රියා කරන්නාක් හෝ මෙනි. ඔවුහු එවැනි කටයුත්තක යෙදී සිට එය අවසන් ව ආපසු ගෙදර ආ විට මිදුලට වී අඳුරු දෙනෙත් විදහා හිස් බැල්මෙන් බලාගත් අත ...............
(අ) මින් කියවෙන්නේ කවුරුන් ගැන ද?
(ආ) ඉරි ඇඳි පදවල අදහස ලියන්න.

(v) සිනිඳු වස්ත්‍ර මිණි අබරණ
තුමුල මාලිගා
සුවඳ බොජුන් සැප සයනා
මිරිවැඩි සඟළා
(අ) මෙවැනි යස ඉසුරු ගැන කතා කරන අයගේ නම ලියන්න.
(ආ) ඉරි ඇඳි පදවල අදහස ලියන්න.

(ලකුණු 4 x 5 = 20 යි.)

03) සතර කන් මන්ත්‍රණය පාඩමේ එන කේවට්ටාචාරීන්

(අ) රාජ පාක්ෂික වූ ද

(ආ) උපායශීලී වූ ද

චරිතයක් ලෙස නිරූපිත ය.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන විමසීමක් කරන්න.

නැතහොත්

(අ) අවස්ථානුකූලව විවිධ විරිත් භාවිත කිරීමත්

(ආ) ගීතවත් බස්වහරක් යොදා ගැනීමත්

නිසා 'ගුත්තිල කාව්‍යය' කාව්‍යමය ගුණයෙන් සපිරුණු නිර්මාණයක් වී ඇත. 'වෙණ මිහිර' පද්‍ය පන්තිය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 15 යි)

04. 'හානා හීය පානා අඬහැරෙන් දනේ ' පද්‍ය පන්තිය

(අ) කාව්‍යමය ගුණයෙන් හා

(ආ) උපදේශාත්මක බවත් කැටි වූ නිර්මාණයකි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

නැතහොත්

'ගංගාවේ සංගීතය' රසවත් නිර්මාණයක් වීමට එහි උපයුක්ත කොට ගත්

(අ) ස්වභාවෝක්ති අලංකාරයත්

(ආ) උත්ප්‍රේක්ෂාලංකාරයත්

අතිශයින් ම හේතු විය.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර සපයන්න.

05) 'බැද්දේගම ආරච්චිගේ ගෙය කැලෑවට ගොස් විනාශ වීම ඉදිරිපත් කර ඇත්තේ අපූරු පරිසර වර්ණනාවකිනි. එය පාඨක සිත් ගනී' උදාහරණ තුනක් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

06) 'මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය පාඨක සිත් තුළ ජාතිකාභිමානී හැඟීම් පුබුදුවාලයි' උදාහරණ තුනක් ගෙන අගය කරන්න.

(ලකුණු 10 යි.)

07) 'සුප්පා දේවිය සිය දරුවන් කෙරේ දක්වූයේ අසීමිත ආදරයකි' ලෙන අතහැර යාම පාඩම ඇසුරින් උදාහරණ තුනක් ගෙන විමසුමට ලක් කරන්න.

(ලකුණු 10 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II,II | පැය / மணித்தியாலம் / Hours: 03 |

සැලකිය යුතුයි:

I වන කොටසෙහි 1,2 ප්‍රශ්නවලටත්, II වන කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් III වන කොටසෙහි 4,5,6,7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.

## I වන කොටස

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ) (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. "දේවයන් වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ සුවදුක් විචාළ සේක".

(අ) මෙම ප්‍රකාශයේ සඳහන්, "අපගේ රජ්ජුරුවන් වහන්සේ" යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?

(ආ) මෙම ප්‍රකාශයේ, " දේවයන් වහන්ස" යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ කවුරුන් හට ද?

ii. "පියරු දැම්මට මුහුණේ ගඳ යනවාදැ?"

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කාහට ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවකදී ද?

iii.
පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැමතැන ලකුණුව ඇත්තේ
කෙලෙස ද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දූන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

(අ) මෙම කවියේ "ඔහු" යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(ආ) මෙම පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.

iv.
**තිරසර** ගුණෙන් යුතු උතුමකු හට පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක **සුනෙර**
පුවතර මෙදඹදිව මළුවෙක සිය ගෙදොර
**ඔහුකර** නොවන සැපතෙක් එබැවින් **කවර**

(අ) මෙම කවියේ අර්ථය ලියන්න

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියා දක්වන්න.

v. "අයියා සල්ලි වගයක් තියන්ඩ දීල තිබුණා. ඒකත් ඉල්ලගෙන උදෙන්ම ගියා. කොහේ හරි සුදුවකටවත් ගියා ද දන් නෑ."

(අ) ඉහත ප්‍රකාශයෙන් ප්‍රකාශ වන්නේ කුමන සිදුවීමක් පිළිබඳව ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතියෙහි රචකයා නම් කරන්න.

(ලකුණු 4x5= 20 යි)

2. පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

වැහි වලා කුළ, පැ කළු යැ යි ඔබේ
　　නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
　　නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ - නැඟී අහසේ පැතිරී ගොසින්,
　　මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්,
　　ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

නද අසා ඔබ ගේ පැහැයත් බලා,
　　මොනරු පිල් විදහා රඟ දෙත් නදින්.
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
　　තුරු ලියත් ලිය - ලයි සැනැසී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
　　ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
　　ගුණ බරින් නැමුණෙ'වි පවතිත් නිතින්

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
　　කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
　　නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
　　'ඔබැ'ඨ අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
　　පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්. (ලකුණු 25 යි)

i. "වැහි වලා කුළ" පද්‍ය පන්තිය සජීවී ගුණයෙන් ඉදිරිපත් කිරීමට කවියා යොදාගත් රචනා උපක්‍රම දෙකක් පැහැදිලි කරන්න.
ii. කවියා මෙම පැදි පෙළ රචනා කිරීමේ දී යොදා ගෙන ඇති කාව්‍යමය භාෂාව කවියේ සාර්ථකත්වයට කොතෙක් දුරට හේතු වී ඇත් ද? අගය කරන්න.
iii. පැදි පෙළ තුළ දක්නට ලැබෙන මිනිස් ගුණ සියුම් ලෙස නිරූපණය කිරීමට කවියා දරා ඇති උත්සාහය පැහැදිලි කරන්න.
iv. කවියාගේ ජීවන දෘෂ්ටිය කෙබඳුදැයි විමසන්න.
v. "වැහි වලාකුළ " පද්‍ය පන්තියේ ප්‍රබල සංකල්ප රූප ඉස්මතු වේ." මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

## II කොටස

3. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට **පමණක්** උත්තර සපයන්න.

එබස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මඟුල් පොකුණේ කරවටක් දියට බැස නෙලුම් පතකින් ඉස වසා ගෙන නෙලුම් මලකින් මූණ වසා ගෙන සිටියාහු ය. බිසවුන් ප්‍රභාවතීන් උයනට කැඳවා ගෙන ගෝස් සවස් වේලෙහි පුෂ්පඵලපල්ලවයෙන් සඤ්ඡන්න වූ සපු දුනුකේ නා පනා සීනිද්ද බෝලිද්ද දෑසමන් ආදී ගස් ලිය ද ගිරා බොකල් ඈ පක්ෂීන් ද දක්වමින් මඟුල් උයන් ඇවිදගෙන ඇගෙ සිත් පෙලඹමින් පොකුණු තෙරට ගියෝ ය. එකෙනෙහි ප්‍රභාවතී තොමෝ පස්පියුමෙන් ගැවසීගත් පොකුණ දැක නහනු කැමතිව පිරිවර හා සමග පොකුණට බැස කෙළිමින් මහබෝධිසත්ත්වයන් මූණ වසා ගෙන සිටි පියුමට අත් දික්කළා ය. එකල්හි රජ්ජුරුවෝ නෙළුම්පත ඉවත් කොට "මම කුස රජ"යි ප්‍රභාවතීන් අත ඇල්ලූ ය. ඔහුගේ මුඛය දැක "යක්ෂයෙක් මා අත අල්වා ගතැ"යි මුරගාමින් භයින් මූර්ඡාව ගියා ය.

එසඳ රජ්ජුරුවෝ අත ඇරපිහ. ඉක්බිති බිසෝ සිහි ලදින් සිතන්නාහු " මා අත ඇල්ලුවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වී නම් ඇත්තල දී ඉලත්තියෙනුත් අස්සල දී අස්බෙටියෙනුත් මුන් විසින් ම ගසන ලදිමි. ඇතුගේ පශ්චිමාසනයෙහි ද මා වෙහෙසවූවෝත් මූ ම ය. මෙසේ විරූප වූ දුර්මුඛ වූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම් ද, ජීවත්ව උනිමි නම් මට වල්ලභයන් අරුම නො වන්නේ ය"යි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා " යාන වාහන සරහව, අද දවසේ ම නික්මෙමි"යි කීහ.

ඔහු එපවත් රජ්ජුරුවන්ට කීවාහු ය. ඒ අසා රජ්ජුරුවෝ "මූ යන්ට අවසර නො ලද්දූ නම් ළය පැළී මිය යන්නාහ. වන්නාට දැනට යෙත්ව"යි නැවත මාගේ බලයෙන් ගෙන්වා ගනිමි සිතා ගමන් අනුදත්හ. එකල්හි ප්‍රභාවතී පිරිවර හා සමග පිය රජ්ජුරුවන්ගෙන් සාගල නුවරට ම ගියෝ ය. ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන්ට ජාතියෙහි කළ ප්‍රාර්ථනාවෙන් නො කැමැති වූව බෝධි සත්ත්වයෝ ද පූර්වයෙහි කරන ලද අකුසල බලයෙන් විරූපව ගියහ

i. මෙම උද්ධෘතය ඇසුරෙන්, කුස ජාතක කතාකරු අවස්ථා හා සිද්ධි ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට සමත් වී ඇති බව නිදසුන් දෙකක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 05යි)

ii. කුස ජාතක කතාකරු අවස්ථාවට උචිත ආකාරයෙන් භාෂාව භාවිතා කොට ඇත. මෙම පාඨය මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iii. ප්‍රභාවතියගේ බලාපොරොත්තු බිඳ වැටී, සංවේගයට පත්වන ආකාරය ජාතක කතාකරු පෙන්වා දෙන ආකාරය විමසන්න. (ලකුණු 05 යි)

iv. "මෙම සිදුවීමේ දී ඔක්කාස රජු ක්‍රියා කළ ආකාරය සර්ව සාධාරණය". මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

<u>නැතහොත්</u>

හිස න්මා ගති ඇ
සිහින් රතැහිලි පටලවා ගති,
සතියකට පෙර ගෙනා වර
විළිබරය මුගෙ රන්වන් මනාලිය

දැල්තිර අස්සෙන්
පෙනෙයි ඇ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඇ
වූවමනාවකින් කිසිත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඇ බඳ සුවඳ
දැනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

(i) අලුත ගෙනා මනාලියගේ ස්වරූපය නිදසුන් දෙකක් මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)

(ii) කවියා යොදා ගෙන ඇති කාව්‍ය ආකෘතිය කවියේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) උපමා භාවිතයෙන් තොර භාෂා භාවිතය සාර්ථක වී ඇත්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) සමස්ත කවිය පුරාම සංකල්ප රූප ඉස්මතු වී ඇති ආකාරය කවි පෙළ ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි)

## III කොටස

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.

( එක් උත්තරයක වචන 100ක්වත් තිබිය යුතු ය.)

4. මනුෂ්‍ය ජීවිතයේ හොඳ නරක ගති ලක්ෂණ පිළිබඳව උපදේශ ඉදිරිපත් කිරීම සුභාෂිතය රචකයාගේ අරමුණයි. නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

5. වෙසක් පහන කෙටිකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇති රචනා උපක්‍රම පිළිබඳව නිදසුන් තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

6. ජන කවියා අවස්ථාවට උචිත ආකාරයෙන් ශබ්ද රසය යොදා ගෙන තිබේ. නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 15යි)

7. ළමයෙකු අත්දකින සිදුවීම් අපූර්වත්වයෙන් යුතුව ඉදිරිපත් කිරීමට තුංමං හංදිය කතුවරයා දැරූ ප්‍රයත්නය,කොතෙක් දුරට සාර්ථක වී දැයි නිදසුන් තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

(ලකුණු 15x2= 30 යි)

***